00063

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ
ඩිප්ලෝමා වැඩ සටහන - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2009/2010

THE OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

**ESD 1131** – මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝකන

කාලය - පැය 02යි.

---

දිනය - 2010.05.16 වේලාව - ප.ව. 02.00 - ප.ව.04.00 දක්වා

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම තුළින් ළමයින්ට අත්වන වාසි පහක් (05) දක්වන්න.

(ලකුණු 10)

(ii) ස්වයං ඉගෙනුම නැංවීම සඳහා පෙර පාසලක් තුළ සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් තුනක් (03) පැහැදිලි කරන්න.

(ලකුණු 15)

02. (i) 'පවුල' යන පදය නිර්වචනය කරන්න.

(ලකුණු 05)

(ii) ශ්‍රී ලාංකික සන්දර්භය තුළ පවුලේ සාම්ප්‍රදායික භූමිකාව පවුලේ වර්තමාන භූමිකාව සමඟ සසඳන්න.

(ලකුණු 10)

(iii) තම දරුවන් සමාජානුගත කිරීමේදී සහ ඔවුන්ට රැකවරණය හා ආරක්ෂාව සැලැස්වීමේදී ශ්‍රී ලංකාවේ පවුල් අද මුහුණ දෙන ප්‍රධාන අභියෝග තුනක් (03) සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

03. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රාථමික පාසල් මට්ටමේදී හඳුන්වා දුන් ප්‍රධාන ලක්ෂණ පහත දැක්වෙන තේමා යටතේ විස්තර කරන්න.

(i) විෂයමාලාව
(ii) ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රම
(iii) පන්තිකාමර පරිසරය

(ලකුණු 8 x 3 + 1 = 25)

04. "1945 නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමෙන් අධ්‍යාපන අවස්ථා පුළුල් වීමත් සමග, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ඉලක්ක විශ්වීය ප්‍රාථමික අධ්‍යාපන ඉලක්ක අභිභවා යා යුතුය."

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිලිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව, මුල් පිටපත 2008.

(i) විශ්වීය ප්‍රාථමික අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනිමේ දී ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග හතරක් (04) දක්වන්න.

(ලකුණු 08)

(ii) ඔබ දැක්වූ අභියෝග ජය ගැනිමට ක්‍රමෝපායයන් දෙක බැගින් යෝජනා කරන්න.

(ලකුණු 17)

05. " පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ශ්‍රී ලංකාවේ ආර්ථිකමය හා සමාජයීය වශයෙන් අවාසිදායක පවුල් සඳහා අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමේ සහ ඉහළ සංචලනය නැංවීමේ මාර්ගයක් විය."

(i) පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය තුළින් ඉහත කාර්යයන් ඉටු කර ගැනිමෙහි ලා කෙතෙක් දුරට සාර්ථක වී තිබේද ? නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(ii) වර්තමානයේ පවතින තත්ත්වය වෙනස් කිරීමට ක්‍රියාමාර්ග තුනක් (03) යෝජනා කරන්න.

(ලකුණු 10)

06. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථානයකට අවශ්‍ය අවම ප්‍රමිතින්.

(ii) සහභාගි වීම සඳහා අයිතිය

(iii) 1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් සන්නිවේදන නිපුණතා

(iv) විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ගේ ප්‍රධාන ප්‍රවර්ග

(ලකුණු 12 ½ x 2 = 25)

\- හිමිකම් ඇවිරිණි. -

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**DIPLOMA IN EARLY CHILDHOOD AND PRIMARY EDUCATION PROGRAMME – LEVEL 03**
**FINAL EXAMINATIONS – 2010**
**ESD 1131 - PERSPECTIVES IN EARLY CHILDHOOD AND PRIMARY EDUCATION**
**DURATION: TWO (02) HOURS**

**Date : 16th May 2010** **Time: 2.00 p.m.- 4.00 p.m.**

**Answer any four (04) questions only.**

01. i. State five (05) benefits children would gain through activity based learning.

(10 marks)

ii. Describe three (03) activities which you could organize at a Pre school to promote self-learning

(15 marks)

02. i. Define the term 'family'

(05 marks)

ii. Compare the traditional role and role of the family in relation to Sri Lankan context.

(10 marks)

iii. Discuss three main challenges faced by Sri Lankan families today when socializing and providing care and protection for their children.

(10 marks)

03. Describe the main features of education reforms introduced at Primary level in 1972 in line with the following themes.
i. Curriculum
ii. Teaching-learning methods
iii. Classroom environment

(8 x 3 +1 = 25 marks)

04. "In the concern of the expansion of education opportunities, since the provision of free education from 1945, it is desirable that Sri Lankan goals should extend beyond universal Primary education"
- National Policy framework on General Education in Sri Lanka First draft - 2008

i. State four (04) challenges faced by Sri Lanka in achieving the goal of universal Primary education.

(08 marks)

ii. Propose two strategies each to overcome the challenges stated by you.

(17 marks)

05. "The Grade V Scholarship Examination has been an avenue for extending educational opportunities and promoting upward mobility of socially disadvantaged families in Sri Lanka.

i. How far the Grade 5 scholarship examinations has been successful in fulfilling the fore mentioned tasks. Describe with examples.

(15 marks)

ii. Suggest these procedures to change the present situation.

(10 marks)

06. Write short notes on two of the following topics.

i. Minimum standards needed for an early childhood care and development centre.
ii. The right to participation.
iii. Competencies in communication introduced by education reforms 1999.
iv. Major categories of children with special needs.

(12 ½ x 2 = 25 marks)

*- Copyrights reserved -*